
ජපානයේ
රැකියා සිහිනය
සැබෑකර ගැනීමට ඔබට අනඟි අවස්ථාවක්
විශේෂිත නිපුණතා සහිත ශ්‍රමික වැඩසටහන (SSW)
ජපානයේ රැකියා අවස්ථා සඳහා
බඳවාගැනීම් (කාන්තා / පිරිමි)
විශේෂිත නිපුණතා සහිත ශ්‍රමික වැඩසටහන (SSW) යටතේ ජපානයේ හෙද සත්කාරක සේවා/ ආහාර සේවා කර්මාන්තය යන ක්ෂේත්‍රයන්ගේ රැකියා ඇබෑර්තු සඳහා බඳවාගැනීමේ වැඩසටහනක් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යංශයේදී පැවැත්වේ.
ඒ සඳහා, මේ සමඟ දක්වා ඇති වෙබ් දිගුව වෙත පිවිස, එහි දක්වා ඇති සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් අදාළ සහතිකපත් හා ලිපිලේඛන ද සහිතව 2024.07.18 දින පෙ.ව. 9.00 ට ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යංශයේ ප්‍රධාන කාර්යාලයේ ශ්‍රවණාගාරය වෙත පැමිණෙන්න.
(සැ.යු.මින් පෙර ජපානය සඳහා වීසා අයදුම්කර ප්‍රතික්ෂේප වී ඇති අයඳුම්කරුවන් මේ සඳහා අයඳුම් කිරීමෙන් වලකින්න)
කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය
ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය
වැඩි විස්තර
0112 277 093
ක්ෂණික ඇමතුම්
1989
පැය 24 පුරාවට
IM Japan
アイム・ジャパン

ශ්‍රී ලංකා **විදේශ සේවා නියුක්ති කාර්යාංශය** හා ජපානයේ **IM Japan** ආයතනය හා එක්ව විශේෂිත නිපුණතා සහිත ශ්‍රමික වැඩසටහන (SSW) යටතේ ජපානයේ හෙද සත්කාරක සේවා ක්ෂේත්‍රය සහ ආහාර සේවා ක්ෂේත්‍රයේ රැකියා ඇබෑර්තු සඳහා බඳවාගැනීමේ වැඩසටහනක් ශ්‍රී ලංකා **විදේශ සේවා නියුක්ති කාර්යාංශයේදී පැවැත්වේ.**

ඒ සඳහා, පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් අදාළ **සහතිකපත් හා ලිපිලේඛන ද සහිතව 2024.07.18 දින පෙ.ව. 9.00 ට නො 234, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, කොස්වත්ත, බත්තරමුල්ල ලිපිනයෙහි පිහිටි ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ ප්‍රධාන කාර්යාලයේ ශ්‍රවණාගාරය වෙත පැමිණෙන්න.**

<u>අවශ්‍ය මූලික සුදුසුකම්.</u>

- වයස 18 - 35 අතර විය යුතුය.
- ජපන් භාෂා ප්‍රවීණතා විභාග JLPT Level 4 හෝ JFT විභාගය සමත් වීම හෝ ඊට ඉහළ සුදුසුකම් තිබිය යුතුය.
- ඉහත රැකියා ක්ෂේත්‍රයකට අදාළ කුසලතා පරීක්ෂණය සමත් විය යුතුය.
- ශරීරයේ Tattoos නොතිබිය යුතුය.
- අ.පො.ස (උ.පෙළ) විභාගය සඳහා පෙනී සිට තිබිය යුතුය. (රජයේ හෝ පෞද්ගලික පාසලක වසර 13 ක අධ්‍යාපන කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.)
- උස - කාන්තාවන් සඳහා 150 cm හෝ ඊට වැඩිවිය යුතු අතර පිරිමි සඳහා 160 cm හෝ ඊට වැඩිවිය යුතුය
- බර - කාන්තාවන් සඳහා 40 Kg හෝ ඊට වැඩිවිය යුතු අතර පිරිමි සඳහා 50 Kg හෝ ඊට වැඩිවිය යුතුය
- දෘෂ්ඨි ආබාධ නොතිබිය යුතුය. (ජපන් දෘෂ්ඨි අගය 0.7 ට වඩා වැඩි හා ශ්‍රී ලංකා දෘෂ්ඨි අගය 6/9 වඩා වැඩි)
- වයස අවු. 35 නොවැඩි ජපානයේ තාක්ෂණික සේවාස්ථ පුහුණුලාභියෙක් ලෙස අවු.03 ක හෝ අවු.05 ක කාලයක් සේවය සම්පූර්ණ කොට ඇති අය සඳහා කුසලතා පරීක්ෂණයට පෙනී නොසිට අයදුම් කල හැකිය.

**(මෙම බඳවාගැනීමේදී පමණක් ලිඛිත හා ශාරීරික යෝග්‍යතා පරීක්ෂණ නොපැවැත්වේ.)**

<u>අවශ්‍ය ලිපිලේඛන.</u>

- ජීව දත්ත පත්‍රිකාව, ජාතික හැඳුනුම්පත සහ ගුවන් ගමන් බලපත්‍රය
- JFT හෝ JLPT N4 සහතිකය
- ශිෂ්‍ය කාර්යය දර්ශකය
- කුසලතා පරීක්ෂණ සහතිකය